# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/35 - 2017 ජනවාරි මස 18 වැනි බදාදා - 2017.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, මේ නියමය මගින්, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අදාළ 1986 සැප්තැම්බර් මස 26 වන දින අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ වූ නියමය, (2016 දෙසැම්බර් මස 1 වන දින 1995/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම නියමයේ (iv) වන ඡේදයේ (ඉ) උපඡේදයේ ''සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය ; සහ'' යන වචන වෙනුවට ''සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම නියමයේ (iv) වන ඡේදයේ (ඉ) උපඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන (ඊ) උපඡේදය එකතු කිරීමෙන් :-
''(ඊ) තාක්ෂණික පීඨය ; සහ'' ;

(3) එම නියමයේ උපලේඛනයේ I වන තීරයේ ඇති ''සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය ;'' යන සටහනට සහ II වන තීරයේ ඇති ඊට අනුරූප සටහන්වලට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස් ඇතුළත් කිරීමෙන් :-

| '' *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| තාක්ෂණික පීඨය | 1. ජෛව පද්ධති තාක්ෂණික අධ්‍යයනාංශය |
| | 2. බහුවිධ අධ්‍යයන අධ්‍යයනාංශය.''. |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 31 වැනි දින.
කොළඹ දී ය.

02 - 102

1A - PG 3348 — 508 (2017/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*